මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/05-2023
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.12. 29

**අයවැය චක්‍රලේඛ අංක: 05/2023**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**2024 වර්ෂය තුළ වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය**

## 01. වියදම් දැරීම සඳහා අධිකාරී බලය

2024 මුදල් වර්ෂය සඳහා වියදම් දැරීමට හැකි වන පරිදි, 2023 අංක 34 දරන විසර්ජන පනත මඟින් වෙන් කර ඇති සීමාවන්ට යටත්ව ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත් කර ගැනීමට අදාළ වූ අධිකාරී බලපත්‍ර සඳහා මුදල් විෂයය භාර අමාත්‍යතුමා විසින් අත්සන් තබා ඇත.

ඒ අනුව, 2024 වර්ෂය තුළ ගෙවීම් වවුචර්පත් හා අදාළ වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

(අ). සාමාන්‍ය පොදු සේවා සඳහා - 2024 අංක 1 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය
(ආ). විශේෂ නීති සේවා සඳහා - 2024 අංක 1 දරන විශේෂ නීති අධිකාරී බලපත්‍රය
(ඇ). අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - 2024 අංක 1 දරන අත්තිකාරම් බලපත්‍රය

## 02. රාජ්‍ය වියදම් සම්බන්ධයෙන් වන කළමනාකරණ වගකීම

සියලුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් තමා යටතේ වන ආයතනවල මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු වේ. එසේම, වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි වියදම් කළමනාකරණය කර ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ, ගණන්දීමේ නිලධාරීන්ගේ මෙන්ම විෂයභාර නිලධාරීන්ගේ ද වගකීම වේ. ඒ අනුව, 2024 වර්ෂය සඳහා වියදම් දැරීමේදී සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් අනුමත ප්‍රතිපාදන සීමා තුළ ස්වකීය ආයතන මෙහෙයවිය යුතු ය.

එමෙන්ම, අයවැය ප්‍රතිපාදන සලසා ගැනීමකින් තොරව ඇති කර ගනු ලබන බැඳීම් සඳහා භාණ්ඩාගාරයේ වගකීමක් නොමැති බැවින් එවැනි වියදම් සඳහා අදාළ නිලධාරීන් පෞද්ගලිකව වගකිව යුතු වේ.

## 03. 2024 වර්ෂයේ රාජ්‍ය වියදම් කළමනාකරණය

2024 වර්ෂය සඳහා වන රාජ්‍ය මූල්‍ය ඉලක්කවලට අනුකූලව යමින් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 0.8කට සමාන අතිරික්ත ප්‍රාථමික අයවැය ශේෂයක් ළඟා කර ගත යුතු බැවින් 2024 වර්ෂය තුළ රාජ්‍ය වියදම් දැරීමේදී, රාජ්‍ය මූල්‍ය විනය ඉතා ශක්තිමත්ව පවත්වාගෙන යාමටත්, විචක්ෂණශීලී ලෙස රාජ්‍ය වියදම් කළනාකරණය කිරීමටත් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. එහිදී දැනට පවතින වියදම් පාලන උපදෙස් තවදුරටත් වලංගු අතර මනා වියදම් පාලනයක් උදෙසා දැනට නිකුත් කර ඇති සියලු චක්‍රලේඛ විධිවිධාන යාවත්කාලීන කර නව චක්‍රලේඛයක් ඉදිරියේදී නිකුත් කරනු ලැබේ.

2024 වර්ෂය තුළ වියදම් දැරීමේදී පහත සඳහන් ප්‍රමුඛතා අනුපිළිවෙළට කටයුතු කළ යුතු වේ.

(අ). හිඟ බැඳීම් පවත්වා නොගත යුතු බැවින් හිඟ බිල්පත් ඇත්නම් නිරවුල් කිරීම
(ආ). අයවැය යෝජනා නිසි පරිදි කඩිනමින් ක්‍රියාත්මක කිරීම
(ඇ). විදේශීය මූල්‍යනය යටතේ ක්‍රියාත්මක, අවසාන අදියරේ පවතින ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඈ). දේශීය මූල්‍යනය මගින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රමුඛතාවයෙන් ඉහළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඉ). ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන වෙන් කර ඇති නව බැඳීම් සම්බන්ධයෙන් වන වියදම්

## 04. වියදම් යෝජනා ක්‍රියාත්මක කිරීම

2024 අයවැය කතාවෙහි සඳහන් වියදම් යෝජනා ක්‍රියාත්මක කිරීම උදෙසා වන ප්‍රතිපාදන එම යෝජනා සෘජුවම අදාළ වන ආයතන වෙත දැනටමත් වෙන් කර දී තිබේ. කෙසේ වුවත්, මාගේ අංක MF/NP/Gen/2024/01 දරණ 2023.12.14 දිනැති ලිපිය මගින් උපදෙස් ලබා දී ඇති පරිදි වියදම් යෝජනා ක්‍රියාත්මක කරනු ලබන ආයතන විසින් එම වියදම් යෝජනාවලට අදාළ ව්‍යාපෘති සංකල්ප පත්‍ර (Project Concept Notes), ව්‍යාපෘති යෝජනා (Project Proposals) සහ ක්‍රියාකාරී සැලසුම් (Action Plans) සකස් කර උක්ත ලිපියෙහි දක්වා ඇති දිනයන්ට ප්‍රථම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. ඇතැම් වියදම් යෝජනා ආයතන කිහිපයක සම්බන්ධීකරණය තුළින් ක්‍රියාත්මක කළ යුතු වන අවස්ථාවලදී අංක 23/2468/601/068 දරණ 2023.12.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මුදල් රෙගුලාසි 208 අනුව අදාළ අනෙකුත් ආයතන වෙත ප්‍රතිපාදන වෙන් කර දීමට ප්‍රතිපාදන වෙන්ව ඇති අමාත්‍යාංශයේ/ආයතනයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් කටයුතු කළ යුතු වේ.

සේවයේ නියුතු හා විශ්‍රාමික රාජ්‍ය සේවකයින්ගේ ජීවන වියදම් දීමනාව වැඩිකිරීම, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් අයකිරීමේ ප්‍රතිශතය සංශෝධනය කිරීම හා පළාත් පාලන ආයතන ස්වයං-මූල්‍යකරණය දිරිගැන්වීම පිළිබඳව වූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාළ චක්‍රලේඛ/මාර්ගෝපදේශ යථා කාලයේදී රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය විසින් නිකුත් කරනු ලැබේ.

අයවැය යෝජනා 2024 අනුව, විසර්ජන පනත මගින් පළාත් සභා වෙනම වියදම් ඒකක ලෙස හඳුනාගැනීම හේතුවෙන් පළාත් ප්‍රධාන ලේකම්වරුන් අයවැය කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් ලෙස පත් කිරීම හා ආනුෂංගික කරුණුවලට අදාළව අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ රාජ්‍ය මුදල්, භාණ්ඩාගාර මෙහෙයුම් හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු විසින් යථා කාලයේදී නිකුත් කරනු ඇත.

## 05. බැඳීම් කළමනාකරණය

සෑම වියදමක් සම්බන්ධයෙන්ම බැඳීම් ඇති කර ගැනීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන පවතින බව තහවුරු කර ගත යුතු ය. නිරවුල් නොවූ වගකීම් එක්රැස්වීම හේතුවෙන් රජය මෙන්ම කොන්ත්‍රාත්කරුවන්/සේවා සපයන්නන් ද අසීරුතාවයන්ට පත්වීම වැළැක්වීම සඳහා ප්‍රතිපාදන වෙන්වී තිබුණ ද බැඳීම් ඇතිකර ගැනීමට ප්‍රථම අක්මුදල් ලබාගැනීමේ හැකියාව තහවුරු කරගැනීම වැදගත් වේ.

2024 වර්ෂය සඳහා ද රු. මිලියන 500 ට වැඩි හෝ වර්ෂ කිහිපයක් තුළ ගෙවීම් කිරීමට සිදුවන ආකාරයේ මුළු පිරිවැය රු. මිලියන 1,000 ට වැඩි ප්‍රාග්ධන වියදම් අයිතම සම්බන්ධයෙන් වගකීම්වලට එළැඹීමට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහි එකඟතාවය ලබා ගත යුතු ය. මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පොරොත්තු ලේඛනයක් නඩත්තු කිරීමටත් ස්වකීය මූල්‍ය තත්ත්වය හා ප්‍රමුඛතාවය අනුව එම දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාදීමටත් කටයුතු කරනු ඇත.

## 06. අමතර ප්‍රතිපාදන ඉල්ලීම

ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ වන "පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය" යටතේ 2024 වර්ෂය සඳහා වෙන් කර ඇත්තේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පමණක් බැවින් **වියදම් ඒකක වෙත වෙන්කර ඇති ප්‍රතිපාදන ඉක්මවා අමතර ප්‍රතිපාදන ලබාදීමේ හැකියාවක් නොමැත.** එබැවින් 2024 වර්ෂය තුළ පැනනගින වියදම්, ලබාදී ඇති ප්‍රතිපාදන තුළ මනාව ප්‍රමුඛතා ගත කරගනිමින් කළමනාකරණය කර ගැනීම අවධාරණය කරමි.

## 07. මුදල් රෙගුලාසි 66/69 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම්

මුදල් රෙගුලාසි 66 යටතේ වන ප්‍රතිපාදන මාරු කිරීම් සඳහා වන ඉල්ලීම් සිදුකළ යුත්තේ වැය දැරීමට ප්‍රථමයෙන් බව අවධාරණය කරමි. මුදල් රෙගුලාසි 66 යටතේ වන ඉල්ලීම් ප්‍රමාණවත් කරුණු සහිතව 2024.12.31 දිනට පෙර ITMIS පරිගණක පද්ධතිය හරහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ නිළධාරීන් වෙත යොමු කළ යුතු ය.

2024.12.31 දිනට පසුව මුදල් රෙගුලාසි 69 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම සිදුකළ හැක්කේ ඒ වන විටත් ප්‍රතිපාදන ඉක්මවා ගෙවීම් කර ඇති අවස්ථාවලදී පමණක් වන අතර මුදල් රෙගුලාසි 69හි දක්වා ඇති පරිදි පූර්ව අධිකාරී බලය ලබා නොගැනීමට හේතු වූ කරුණු පැහැදිලිව පිළිගත හැකි පරිදි ඉදිරිපත් කර නොතිබේ නම් එවැනි මාරු කිරීම් අනුමත නොකරන බවද අවධාරණය කරමි.

## 08. අත්තිකාරම් ගිණුම් කටයුතු

2024 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු පවත්වා ගත යුතු අතර උපරිම වියදම් සීමාව වැඩිකිරීම සඳහා අවසර නොලැබෙන බැවින් වරින්වර සමාලෝචනය කරමින්, මෙම සීමාවන් තුළම වියදම් කළමනාකරණය කර ගත යුතු වේ.

මෙහිදී නිෂ්පාදන, වෙළඳ හා විශේෂ අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් නියම කර ඇති අවම ලැබීමේ සීමාව ළඟාකර ගැනීම හා උපරිම බැරකම් සීමාව නොඉක්මවීම පිළිබඳව විශේෂ අවධානයකින් කටයුතු කළ යුතු ය.

2024.01.01 දින සිට සියලුම රාජ්‍ය සේවකයින් පෙර පරිදි ආපදා ණය පහසුකම් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබනු ඇත.

## 09. පොදු

රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් තම විෂයපථයට අයත් කාර්යයන් වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා සිදුකර ගැනීමේදී එම කාර්යය ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි අදාළ මුදල් වර්ෂයේ අවසාන කාර්තුවට ප්‍රථම මුදල් රෙගුලාසි 208 යටතේ අයවැය ප්‍රතිපාදන පවරා දීම සිදුකළ යුතු ය.

කෙසේ වෙතත්, ආපදා තත්ත්වයකදී හෝ එවැනි හදිසි අවස්ථා තත්ත්වයකදී පමණක් අදාළ මුදල් වර්ෂයේ අවසාන කාර්තුව තුළ මුදල් රෙගුලාසි 208 යටතේ ඉහත පරිදි ප්‍රතිපාදන පවරා දෙනු ලබන්නේ නම් ඒ සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු වේ.

අතිරේක ප්‍රතිපාදන සහ මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම් සඳහා අනුමැතිය ඉල්ලීම් මහාභාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමේදී ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ/අමාත්‍යාංශ ලේකම්වරයාගේ අත්සනින් ඉදිරිපත් කළ යුතු බව අවධාරණය කරමි. එවැනි ඉල්ලීමක් භාණ්ඩාගාරය වෙත යොමු කිරීමට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා/අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පෞද්ගලිකවම එහි අත්‍යාවශ්‍යභාවය සහ අදාළ වියදම පවතින ප්‍රතිපාදන තුළ කළමනාකරණය කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලිය යුතුය.

1971 අංක 38 දරණ මුදල් පනතේ 8 (2) (අ) සහ (ආ) විධිවිධානවලට අනුකූලව ව්‍යවස්ථාපිත මණ්ඩල විසින් ප්‍රාග්ධන වියදම් දැරීමට මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම් 2024.01.15 දිනට ප්‍රථම මහාභාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ.

**10. පැහැදිලි කරගැනීම**

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් අවශ්‍ය පැහැදිලි කර ගැනීම්, ඇමුණුම් 01 හි දක්වා ඇති ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය පිළිබඳ වගකීම දරන නිළධාරියා හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (0112-484681) මගින් ලබා ගත හැකි ය.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව

# Department of National Budget

## List of Subject Officers

| Head No. | Ministries/Special Spending Unit | Name of the Officer in Charge | Designation | Contact No. | Official E-Mail Address |
|---|---|---|---|---|---|
| 1. - 22 | Special Spending Unit | Ms. Anjalika Gunasekara | Director | 011-2484688 (Ext. -1337) | gunasekera.ak@nbd.treasury.gov.lk |
| 101 | Buddha Sasana, Religious and Cultural Affairs | Ms. Sanjeewani Weerasekara | Director | 011-2484685 (Ext. -1308) | weerasekara.wmsk@nbd.treasury.gov.lk |
| 102 | Finance, Economic Stabilization and National Policies | Mr.M.M.M.N.Mohotty | Assistant Director | 011-2484740 (Ext. -1115) | mohotty.mmmn@nbd.treasury.gov.lk |
| 103 | Defence | Ms.Lakshika Senarathna | Deputy Director | 011-2034429 (Ext. -4346) | senarathna.pdlp@nbd.treasury.gov.lk |
| 105 | Mass Media | Mr. P.R.K.Senanayake | Director | 011-2151457 (Ext. -2306) | senanayake.prk@nbd.treasury.gov.lk |
| 110 | Justice, Prisons Affairs and Constitutional Reforms | Mr. P.R.K.Senanayake | Director | 011-2151457 (Ext. -2306) | senanayake.prk@nbd.treasury.gov.lk |
| 111 | Health | Ms.Jamithri Amarasekara | Deputy Director | 011-2484667 (Ext. -1302) | amarasekara.hljk@nbd.treasury.gov.lk |
| 112 | Foreign Affairs | Mr. Viraj Wijewardena | Director | 011-2484677 (Ext. -1313) | wijewardhana.hrvp@nbd.treasury.gov.lk |
| 116 | Trade, Commerce and Food Security | Mr.W.M.R. Wijekoon | Director | 011-2484690 (Ext. -1324) | wijekoon.wmr@nbd.treasury.gov.lk |
| 117 | Transport & Highways - Transport | Mr. J.M.Herath Banda | Director | 011-2484894 (Ext. -1008) | banda.jmh@nbd.treasury.gov.lk |
| | Transport & Highways - Highways | Mr. Parakrama Thennakoon | Deputy Director | 011-2484858 (Ext. -1279) | tennakoon.tmdp@nbd.treasury.gov.lk |
| 118 | Agriculture | Ms.G.G.U.K.Wijeratne | Assistant Director | 011-2484760 (Ext. -1326) | wijeratne.gguk@nbd.treasury.gov.lk |
| 119 | Power & Energy | Ms. Punya Rajapaksha | Deputy Director | 011-2484581 (Ext. -1010) | rajapaksha.rap@nbd.treasury.gov.lk |
| 122 | Tourism and Lands | Ms.Thoshini Jayaweera | Assistant Director | 011-2484600 (Ext. - 2024) | jayaweera.jmty@nbd.treasury.gov.lk |
| 123 | Urban Development and Housing | Mr. J.M.Herath Banda | Director | 011-2484894 (Ext. -1008) | banda.jmh@nbd.treasury.gov.lk |
| 126 | General Education and Higher Education | Ms.R.M.S.M. Ragaguru | Director | 011-2034445 (Ext. -2084) | rajaguru.rmsm@nbd.treasury.gov.lk |
| | Vocaonal Education | Ms. Sanjeewani Weerasekara | Director | 011-2484685 (Ext. -1308) | weerasekara.wmsk@nbd.treasury.gov.lk |
| 130 | Public Administration, Home Affairs, Provincial Councils and Local Government | Mr. M.J.M. Ifham | Director | 011-2484687 (Ext. -1322) | ifham.mjm@nbd.treasury.gov.lk |
| | District Secretariats | Ms.Lakmali Samarasekara | Deputy Director | 011-2484600 (Ext. - 1719) | samarasekara.sal@nbd.treasury.gov.lk |
| 149 | Industries | Mr.Rasika Wijekoon | Director | 011-2484690 (Ext. -1324) | wijekoon.wmr@nbd.treasury.gov.lk |
| 151 | Fisheries | Ms. H.M.T. Madhushani | Assistant Director | 011-2484600 (Ext. - 1775) | madhushani.hmt@nbd.treasury.gov.lk |
| 160 | Environment | Ms.Chandrika Senanayayake | Director | 011-2484579 (Ext. -1151) | senanayake.c@nbd.treasury.gov.lk |
| 161 | Wildlife and Forest Resources Conservation | Ms.Chandrika Senanayayake | Director | 011-2484579 (Ext. -1151) | senanayake.c@nbd.treasury.gov.lk |
| 166 | Water Supply | Mr. J.M. Herath Banda | Director | 011-2484894 (Ext. -1008) | banda.jmh@nbd.treasury.gov.lk |
| 171 | Women, Child Affairs and Social Empowerment | Ms Sreeni. Karunarathna | Additional Director General | 011-2034527 (Ext. -1320) | karunarathna.hwsp@nbd.treasury.gov.lk |
| 176 | Ports, Shipping and Aviation | Ms. Punya Rajapaksha | Deputy Director | 011-2484581 (Ext. -1010) | rajapaksha.rap@nbd.treasury.gov.lk |
| 186 | Technology | Mr.Rasika Wijekoon | Director | 011-2484690 (Ext. -1324) | wijekoon.wmr@nbd.treasury.gov.lk |
| 187 | Investment Promotion | Mr. Parakrama Thennakoon | Deputy Director | 011-2484858 (Ext. -1279) | tennakoon.tmdp@nbd.treasury.gov.lk |
| 189 | Public Security | Mr. P.R.K.Senanayake | Director | 011-2151457 (Ext. -2306) | senanayake.prk@nbd.treasury.gov.lk |
| 193 | Labour and Foreign Employment | Ms. G.D.M. Muditha Gunarathne | Accountant | 011-2151456 (Ext. -2027) | gunaratna.gdmm@nbd.treasury.gov.lk |
| 194 | Sports and Youth Affairs | Ms.Irudini Weerakoon | Assistant Director | 011-2484600 (Ext. - 1720) | weerakoon.wmiu@nbd.treasury.gov.lk |
| 198 | Irrigation | Ms.Thoshini Jayaweera | Assistant Director | 011-2484600 (Ext. - 2024) | jayaweera.jmty@nbd.treasury.gov.lk |
| 501 | Non Cabinet Ministry of state Plantation Enterprises Reform | Mr. Danasiri Wijebandara | Director (Act.) | 011-2484683 (Ext. -1318) | wijebandara.wmd@nbd.treasury.gov.lk |
| | Advance Account Activities | Ms. G.D.M. Muditha Gunarathne | Accountant | 011-2141546 (Ext. -2027) | gunaratna.gdmm@nbd.treasury.gov.lk |
| | ITMIS - Overall coordination | Mr. Danasiri Wijebandara | Director (Act.) | 011-2484683 (Ext. -1318) | wijebandara.wmd@nbd.treasury.gov.lk |